1 වන පිටුවෙන් (විමල් යනු)

පුළුස්සා දැමූ සිය දහස් සංඛ්‍යාත මිනිසුන් පිළිබඳ දිවා රෑ අවිළුණු මතකයන්, ඒ ආත්මය තුළ නිධන්ව තිබිණ. එය, මළවුන් කසළ කඳු මෙන් අමතක කර නොදැමූ සමයකි. මර්දනකාරී අග්නියේ ගිනියම වැදී වැදීත්, අත් නොහළ සිහින වෙනුවෙන් සිය දිවිය අවදානමේ ලා රහසේ සටන් කළවුන් බොහෝ දෙනා අතර විමල් ද වෙහෙස නොබලා වැඩ කළේය. අළු මතින් නැගී ගත් සරසවි ශිෂ්‍ය ව්‍යාපාරය තුළ පැළපදියම් වන්නට මාන බැලූ ජාතික චින්තන වර්ගවාදයට එරෙහිව සරසවි වේදිකා මත ඔහුගේ හඬ අභියෝගයක්ව රැව් දුන්නේය. රහසිගත පක්ෂ කණ්ඩායමේත්, 'හිරු' පත්‍රයේත් වැඩ බරින් වෙහෙස වූ බදාදාවේ මැදියම් රැ යක, මහරගම බෝකුන්දර විද්‍යාල මාවතේ එස්.ආර්.එස්. මුද්‍රණාලයේ බිම එළාගත් පත්තර කඩදාසි මත වැතිරී නිදි වැරූ තරුණයෙකුගේ නොතිත් සමාජ අනුරාගය පිළිබඳ සිතුවිල්ල, අතීත මතක අඳුරේ සදාතන ගිනි සිළකි.

1994 මහ මැතිවරණයෙන් පසු විමල් මහා දේශපාලකයෙකුගේ රූපකායක් දක්වා පරිණාමය විය. බල දේශපාලන විස්මලන්තයේ දොර සිංහල පහළ මැද පංතියේ කැරලිකාරී තරුණයෙකු හමුවේ විවර විණ. 'හෘදය සාක්ෂිය යනු මිනිසාගේ මාළිමාව' යැයි ඕලන්ද සිතුවම්කරු 'වින්සන්ට් වැන් ගෝ' වරෙක ලීවේය. බලය හා පුද්ගල සමෘද්ධිය පිළිබඳ කෙටි මාවත් ගහණ ඒ විස්මලන්තයේදී විමල් අතින් පමණක් නොව, ජවිපෙ අතින්ද ඒ මාළිමාව ගිළිහිණ. කර කැපූ ජාතික බැනියමක් හැඳ ජාතික චින්තනයේ පීතෘවරුන් සමඟ රජයේ හමුදා කඳවුරු අතර යුදවාදී උද්වේග ය පතුරුවන්නට සැරිසරණ විමල් විසින්, හුදු පුද්ගලයෙකුගේ පමණක් නොව, මුළුමහත් දේශපාලන ව්‍යාපාරයකම සදාචාරාත්මක වැහැරී යාමේ තරම හකුළා පෙන්වන ලදී. තම පක්ෂය තමන්ට කළ 'කෙණෙහිලිකම්' ගැන කතානායකවරයාට පැමිණිලි කරන්නට අප්‍රේල් 08 වෙනිදා පාර්ලිමේන්තුව තුළ නැගී සිටි විමල්, අනතුරුව එළඹි පැයේදී සිය ආපසු ගමන සම්පූර්ණ කළේය. උත්තර සමාජයක් පිළිබඳ වූ අචල විශ්වාසයෙන් සටන් කොට, වධ විඳ ජීවිත දුන් - සිරබත් කෑ පරම්පරා දෙකක ලක්ෂ සංඛ්‍යාත ගැහැණුන් සහ මිනිසුන්ගේ අනූපමේය පරිත්‍යාගයන්ගෙ ' යශෝ කීර්තියේ මහිමයෙන් පාර්ලිමේන්තු සභාගැබට ඇතුල් වූ මිනිසෙකු, 'උසස් පෙළ විභාගය අත් හරින්නට සිදුවීමේ හා සීගිරි නොයෑමේ පරිත්‍යාගයන්' පිළිබඳ උද්වේග යෙන් කතා කළේය. මහා දේශපාලකයෙකුට වසන් වූ ඔහුගේ අඟුටුමිටි ආත්මය, ගූඪ අඳුරින් පිරි ඒ සභා ගර්භය තුළ සැඟවෙන්නට තැනක් සොයන්නා සේ මට හැඟිණ.

සමාජ යුක්තිය හා මිනිස් සමානත්වය පිළිබඳ ආවේශයෙන් ඇවිළුණු සිය අතීත දවස් දෙස ඉඳහිට දවසකවත් හිස පොවා ආපසු බලන්නට හැකි එකම එක කවුළුවක් හෝ සිය ජීවිතය තුළ ඔහු ඉතිරි කොට තබාගත්තේදැයි මම නොදනිමි. අතීතයේ ඇතැම් දවසක නිමාවේදී, කොල්ලුපිටියේ 15 වෙනි පටුමගේ කාර්යාලයෙහි කරදිය සුළඟින් තෙතබත් උඩුමාලයේ ඉදිරිපස පියගැට පෙළෙහි වාඩිවී, 'ඔරු වසන්ත කාලම්' චිත්‍රපටයේ 'ආරාරෝ - ආරිවරෝ' ගීතය ගයන සොඳුරු මිතුරෙකු-ගේ සෝබර හඬ දැන් දුර ඈත මතක මාත්‍රයකි.

විමල් යනු කුමක්ද?

විමල් යනු, ජනතා විමුක්ති පෙරමුණ ඉකුත් දශක එක හමාරක කාලය තුළ අභිරුචියෙන් ශක්තිමත් කළ ස්වයං ප්‍රශංසාවේත්, නග්න වර්ගවාදයේත්, දේපාලන අවස්ථාවාදයේත් පුද්ගල ප්‍රකාශනයයි.

කීත් ගෝඩින්ගේ 'මදර් නයිට්' සිනමා පටයේ එන හොවාර්ඩ් කැම්ප්බල්, ඇමරිකානුවන්ට ඔත්තු සැපයීම පිණිස නාසි නිළධාරියකු වශයෙන් ව්‍යාජ ලෙස පෙනී සිටිමින් යුදෙව් විරෝධී මත පතුරුවන්නෙකි. ලෝක යුද්ධයෙන් පහළොස් වසරකට පසු දිවි නසා ගැනීමට පෙරාතුව අතීතාවර්ජනයේ යෙදෙන ඔහු මෙසේ කියයි. 'ඔබ ගන්නා ව්‍යාජ වේශය පිළිබඳ ඔබ ප්‍රවේශම් විය යුතුය. මක් නිසාද යත්, අවසානයේදී ඔබ ඒ ව්‍යාජයම බවට පත්විය හැකි බැවිනි.'

ඛේදනීය ඇත්ත එයයි.

'ජාතික නිදහස් පෙරමුණ' යනු විමල් වීරවංශගේ පුද්ගල උන්නතිකාමයේ තාර්කික අන්තයයි. එය ජනතා විමුක්ති පෙරමුණේ දෙබිඩි දේශපාලනයේ තාර්කික වන්දියයි.

*(අනුග්‍රහය - ලංකා ඊ නිව්ස්)*

# දෙවිවරු ප්‍රශ්නයක් නොවේ

***හොඳ වැඩ කරන කෙනෙකුට දේව බැල්ම තියෙනවා කියන්නෙ; සෑම විටම තමන් කරන වැඩ අවබෝධයෙන් යුතුය - සිහියෙන් යුතුව නිවැරදිව කර ගන්නා නිසා නොවේද? එයම නොවේද ස්වභාව ධර්මය සමග ජීවත් වෙනවා යයි කියන්නේ. සෑම කෙනෙක්ම ඒ විදියට ජීවත් වෙනවා නම් ඉරිසියාව - ක්‍රෝධය - සොර මැර කම් - අපරාධ සිත් තුළ ඇති වී විනාශ සිදු වෙයිද? අපි තව කෙනෙකුට ආදරය කිරීමට පුරුදු පුහුණු කර ගත යුතුයි. අඩුගානේ දෙවියන්ට නෙවෙයි තමා තමන්ටවත් ප්‍රශ්නයක් කර නොගෙන ජීවත් වෙන්න ඉගෙන ගත්තා වෙනවා නේද ?***

දෙවියන් ප්‍රශ්නයක්ද ? යන්නට අළුත් අරුතක් දෙමින් සන්නස 2008 ජූනි කලාපයෙහි සුසංග කොස්තා ලියූ ලිපියට ආගම් පටලවාගෙන ඇති බවක් පෙනේ. මේ ලෝකයේ ගෞතම බුදුරජාණන් වහන්සේ වදාළ ඒ සම්බුදු දහම හැර දෙවියන් යදින - අදහන කොපමණ පිරිසක් සිටිනවාද යන්නට පිළිතුරක් මම නොදනිමි. එම ශ්‍රී සද්ධර්මය නිරවුල් ලෙස පිරිසිඳු ලෙස ඉතාම ටික දෙනෙකු අතර හෝ ඒ අයුරින්ම පවතින රටක පුරවැසියෙකු ලෙස ඔබගේ එක කාරණයකට මට එකඟ විය නොහැක.

ඒ කුමක්ද යත් ? මීට අවුරුදු 2550කට පෙර සිද්ධාර්ථ ගෞතම නමින් උපත ලැබූ ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ බුදුබව ලැබීමට පෙර සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයකටත් පෙර සිට බුදුබව පතා පෙරුම් පුරා ඇත. (එය ඔබ මම ඉපිද සිටින මේ අවුරුදු 100ක කාලයකට සමකල නොහැක. මොකද? එය ඉතා දීර්ඝ කාලයක් බැවිනි.) එතුමාගේ සම්බුද්ධත්වය නිසා නිවන් දැක්වූ දෙව් මිනිස් ප්‍රමාණය ඉතා විශාලය. මිහිඳු මාහිමියන් ලක්දිවට බුදු දහම ගෙන ආවේ රහත් භාවය ලැබීමෙනුත් අනතුරුවය. ලංකාවේද රහතන් වහන්සේලා අපමණ විසූ බව බෞද්ධ පොත පත ඇසුරු කරන්නන් දන්නවා ඇත. එසේ තිබියදී ගෞතම බුදුන්ගෙන් පසු නිවන් ලැබූ එකද රහතන් වහන්සේ නමකුත් නැති බව කියන්නේ කෙලෙසද යන්න මට ඇතිවූ ප්‍රශ්නයකි. ඔබ කියනා ලෙසට ගෞතම බුදුන් වහන්සේගෙන් පසු නැවත නිර්වාණය ලබන එකම තැනැත්තා මෛත්‍රී බුදුන්ද?

සත්‍යය අවබෝධ කරගත් අයම පමණි සත්‍යය සත්‍යයක්ම ලෙසට හඳුනා ගන්නේ. කල්ප ගණනකට එකම බුදු කෙනෙකුන් ලොව උපදින්නේ පසමහ බැලුම් බැලීමෙන් පසුවයි. එයට හේතුව ධර්මය අවබෝධ කරගත හැකි පිරිසක් ලොවේ ඉපදෙන කාලයක් වීමය. එසේ නැතිනම් සම්මා සම්බුදු වරයෙක් මෙලොව ඉපදීමෙහි තේරුමක් නැතිව යනවා නොඅනුමානය. අවුරුදු 2550කටත් අධික කාලයක් ගතවීත් තාම ඒ නිර්මල බුදු දහම මෙලොව පවතින්නේ එහි යථා ස්වභාවය එලෙසින්ම අවබෝධ කර ගැනීමට හැකි පිරිස් තාම අතරින් පතර හෝ සිටින නිසාය. ඔවුන් අඩු තරමින් පස් පවින් වත් වැලකී සිටීමට උත්සහ කරන අය වෙති. (එනම් ප්‍රාණ ඝාතය, අදත්තාදානය, කාමමිථ්‍යාචාරය, මුසාවාදය සහ සුරාපානය) මේ පස් පව් කරමින් දිවිගෙ වන පුදුගලයන් අතින් මොන තරම් බරපතල වැරදි - අපරාධ සිදුවෙන්න පුළුවන්ද? ඒවා දෙවියන් විසින් නොව තම තමන් කරගන්නා දේවල්ය.

හොඳ වැඩ කරන කෙනෙකුට දේව බැල්ම තියෙනවා කියන්නෙ; සෑම විටම තමන් කරන වැඩ අවබෝධයෙන් යුතුය - සිහියෙන් යුතුව නිවැරදිව කර ගන්නා නිසා නොවේද? එයම නොවේද ස්වභාව ධර්මය සමග ජීවත් වෙනවා යයි කියන්නේ. සෑම කෙනෙක්ම ඒ විදියට ජීවත් වෙනවා නම් ඉරිසියාව - ක්‍රෝධය - සොර මැර කම් - අපරාධ සිත් තුළ ඇති වී විනාශ සිදු වෙයිද? අපි තව කෙනෙකුට ආදරය කිරීමට පුරුදු පුහුණු කර ගත යුතුයි. අඩුගානේ දෙවියන්ට නෙවෙයි තමා තමන්ටවත් ප්‍රශ්නයක් කර නොගෙන ජීවත් වෙන්න ඉගෙන ගත්තා වෙනවා නේද ?

පද්මිණී කළුආරච්චි

ග්ලැඩිස්ටන් පාක්




